සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

විෂය - ගිණුම්කරණය

සතිය - 8

ශ්‍රේණිය - 13

සකස් කළේ -

නිපුණතාව 14.0 - කළමනාකරණ ගිණුම්කරණයේ මූලික සංකල්ප ඇගයීමට ලක් කරයි.

ක්‍රියාකාරකම් 1

නිෂ්පාදන ආයතනයක පහත ඇස්තමේන්තුවක තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| නිෂ්පාදන ඒකක සංඛ්‍යාව | ඒකක 16,000 |
| මුළු සෘජු ද්‍රව්‍ය පිරිවැය | රු. 8,00,000 |
| මුළු සෘජු ශ්‍රම පිරිවැය (පැය 2000 ක් සඳහා) | රු. 480,000 |
| මුළු සෘජු වෙනත් පිරිවැය | රු. 320,000 |
| මුළු ප්‍රාථමික පිරිවැය | රු. 1,600,000 |
| මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය | රු. 2,400,000 |
| මුළු නිෂ්පාදන පිරිවැය | රු. 4,000,000 |
| මුළු නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය | රු. 640,000 |

අනෙකුත් තොරතුරු

කාලච්ඡේදය සඳහා යන්ත්‍ර පැය 8000 ක් අවශ්‍ය වේ.

**අවශ්‍ය වන්නේ**

පහත එකිනෙක පදනම යටතේ පොදුකාර්ය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාත ගණනය කරන්න.

1. නිෂ්පාදන ඒකක පදනම
2. සෘජු ද්‍රව්‍ය පිරිවැය පදනම
3. සෘජු ශ්‍රම පිරිවැය පදනම
4. ප්‍රාථමික පිරිවැය පදනම
5. සෘජු ශ්‍රම පැය පදනම
6. යන්ත්‍ර පැය පදනම